සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - I** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි :
- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. ලොවේ බිහිවූ සෑම නබිවරයෙක්ම, රසූල්වරයෙක්ම දේශනා කළ එකම දෙය,
(1) ෂරීආ (2) අකීදා (3) ඉබාදා (4) ඉමාරා

02. ''මා ජීවත්ව සිටියදී ඉස්ලාමය විනාශ වී යාමට වඩා ඉස්ලාම් ජීවත්ව සිටියේදී මා මියයාම උතුම්ය.'' යන වදන කියූ ඉමාම් වරයා,
(1) ඉමාම් බුහාරි (රහ්) (2) ඉමාම් මාලික් (රහ්) (3) ඉමාම් අහ්මද් (රහ්) (4) ඉමාම් ෂාෆි (රහ්)

03. නබිවරුන්ට ලබාදෙන හාස්කම්,
(1) කරාමත් (2) මුහ්ජිසාත් (3) කිලාපත් (4) රිසාලත්

04. ඊමානයට පටහැනි වන වචනය,
(1) ෂිර්ක් (2) කුෆ්ර් (3) නිෆාක් (4) ඉල්හාද්

05. මට නම් බොහොමයක් තිබේ. මම මොහොම්මද් වෙමි. මම අහ්මද් වෙමි. මම තමයි 'මාහි' යන හදීසයේ සඳහන් පුද්ගලයා 'මාහි' නමැති වචනයේ තේරුම,
(1) එක්රැස් කරන්නා (2) අවසානයා
(3) ප්‍රශංසාවයට ලක්වන්නා (4) විනාශකර දමන්නා

06. අස්වදුල් අන්සි නැමති ව්‍යාජ නබිවරයා ඝාතනය කළ සහාබාවරයා,
(1) ෆයිරූස් තෛලමී (රලි) (2) වහ්ෂි (රලි)
(3) කාලිද් බින් වලීද් (රලි) (4) සෙඉද් (රලි)

07. ව්‍යාජ නබි ලෙස ආ කාන්තාව,
(1) තුලෛහා (2) මුසෛලමා (3) අස්වදුල් අන්සි (4) සජාහ්

08. ඔටුවන්ගේ ආරම්භ නිසාබ් (ප්‍රමාණය)
(1) 40 (2) 30 (3) 5 (4) 50

09. සකාත් ලබා ගැනීමට සුදුසුකම් ලත් අය අතරින් ''කාරිමූන්'' යනු
(1) ණයකාරයෝ (2) දුප්පතුන් (3) අසරණයෝ (4) අනාතයින්

10. මක්කා ජයගත් හිජ්රි වසර,
(1) 6 (2) 8 (3) 10 (4) 12

11. දුප්පතාගේ දුක හඳුනාගන්නා ඉස්ලාම් වගකීම කුමක් ද?

(1) සලාතය (2) සකාතය (3) උපවාසය (4) හජ්

12. දුල්හජ් මාසයේ කීවෙනි චන්ද්‍ර දිනයේදී ද හාජිවරු අරෆාවේ රැඳෙන්නේ,

(1) 8 (2) 9 (3) 10 (4) 11

13. සිය වසර කිහිපයකට පෙර ජුර්හුම් ගෝත්‍රය වසා තැබූ සම්සම් ළිඳ නැවත සොයා ගත්තේ,

(1) අබුතාලිබ් (2) අබුලහබ් (3) අබුජහ්ල් (4) අබ්දුල් මුත්තලිෆ්

14. ඉස්ලාම් පාලනය බිඳවැටුණු කාලය,

(1) 1948 (2) 1924 (3) 1977 (4) 1928

15. 'ඉවසීමෙන් හා සලාතයෙන් උදව් පතන්න' යන වචනයේ සඳහන් වී ඇත්තේ,

(1) අල් හදීස් වලින් (2) අල්කුර් ආණයෙන් (3) ඉමාම් වරුන්ගෙන් (4) ඉතිහාසයෙන්

16. අල්කුර් ආණයේ ඉදිරියේ තම නොහැකියාව පිළිගෙන කවි කීම නතර කළ කවියා,

(1) වලීද්ඉබ්නුමුහීරා (2) ඉම්රාඋල්කෙයිස් (3) ලබීද් (4) ෆරස්තක්

17. වහී මත්ලු වලට උදාහරණයක්,

(1) අල්කුර්ආණය (2) අල්හදීස් (3) ඉජ්මාහ් (4) කියාස්

18. නබි (සල්) තුමාණන්ගේ ක්‍රියාවන් හදීස්වල සඳහන් කර ඇති ආකාරය,

(1) කව්ලි (2) තක්රීරි (3) ෆිඅලි (4) ජුස්ඉ

19. සහීහ් බුහාරිවල ඇතුළත් කර ඇති හදීස් ගණන,

(1) 7275 (2) 4000 (3) 4800 (4) 4341

20. ඉමාම් අබුහනීෆා (රහ්) ඉපදුණු ස්ථානය,

(1) මක්කා (2) මදීනා (3) කූෆා (4) බසරා

21. මද්රසතුල්අසර් යනුවෙන් නම් කළ ෆික්හු සිතුවිල්ලට අයත් ඉමාම් වරයා,

(1) අබූහනීෆා (2) ෂාෆි (3) හම්බල් (4) මාලික්

22. ඉජ්තිහාත් මූලික කොටගත් කලාව,

(1) ෆික්හු (2) තබ්සීර් (3) හදීස් (4) තජ්වීද්

23. සකාත් දීමට එකඟ නොවූ කණ්ඩායම මර්දනය කළ කලීෆා,

(1) අබුබක්කර් (රලි) (2) උමර් (රලි) (3) උස්මාන් (රලි) (4) අලි (රලි)

24. ඉස්ලාම් කිලාපතයේ නාවික හමුදාවක් බිහිකළ පාලකයා,

(1) හජ්ජාජ් (රලි) (2) මුස්අබ් (රලි) (3) මුආවියා (රලි) (4) මුආද් ඉබුනු ජබල් (රලි)

25. ''අසදුල්ලා අල්ලාහ්ගේ සිංහයා'' යන නාමය ලැබූ කලීෆා වරයා,

(1) අබුබක්කර් (රලි) (2) උමර් (රලි) (3) උස්මාන් (රලි) (4) අලි (රලි)

26. නබි මොහොම්මද් තුමානන් විසින් ශ්‍රී ලංකාවට ක්‍රි.ව. 628 දී යවන ලද සහාබිවරයා,

(1) වහහ් ඉබ්නු අබි හජ්සා (රලි) (2) කාලිද් ඉබ්නු වලීද් (රලි)

(3) මුස්අබ් ඉබ්නු උමෛර් (රලි) (4) උමර් ඉබ්නු හත්තාබ් (රලි)

The National e-learning Portal for the General Education

27. සින්දු දේශය කෙරෙහි සේනාවක් යවා එය ජයලබා ගත් නායකයා,

(1) තාරික්ඉබ්නු සියාද් (2) මුහම්මද් බින් කාසිම් (3) හජ්ජාජ් ඉබ්නු යූසුෆ් (4) කාලිද් ඉබ්නු බකායා

28. විවාහ වීමට නොගැලපෙන ඥාතියා,

(1) අජ්නබි (2) මහ්රම් (3) ඊජාබ් (4) කබූල්

29. බිරිඳක් විසින් ලෝකයේ බොහෝ සේ ගරුකළ යුතු වන්නේ,

(1) පියා (2) සහෝදරයෝ (3) ස්වාමිපුරුෂයා (4) අසල්වැසියා

30. කෙනෙකු තම බිරිඳව මවට සමාන කිරීම හැඳින්වන්නේ කෙසේ ද?

(1) ලිආන් (2) ඊලාඋ (3) කුල්උ (4) ලිහාර්

31. ශ්‍රී ලංකාවේ ජීවත්වන මුස්ලිම්වරු පිළිපදින අකීදා කොටස්,

(1) තහාවීයියා (2) අෂ්ආරියියා (3) සාදුලියියා (4) කදරීයියා

32. ඉමාම් තිර්මිදි (රහ්) උපන් ස්ථානය කුමක් ද?

(1) කුරාසාන් (2) ෂබර්කන්ද් (3) ගාසා (4) තිර්මිදි

33. කසපහර 40 ක් ලබා දෙන්නේ කුමන වරදකට ද?

(1) කටකතා වලට (2) සොරකමට

(3) මත්පැන් පානය කිරීමට (4) මිනීමැරුමට

34. නබි(සල්) තුමාට 'වහි' පහල වූ කඳු ගුහාව පිහිටා ඇති කඳුවැටිය,

(1) සෆා (2) මර්වා (3) උහද් (4) ජබලුන් නූර්

35. ඊමානයයි කුෆ්රයයි අතර වෙනස,

(1) සලාතය (2) සව්ම් (3) සකාතය (4) හජ්

36. කෙටිකර හෝ එක්කළ නොහැකි සලාතය,

(1) ලුහර් (2) මහ්රිබ් (3) සුබහ් (4) ඉෂා

37. මක්කාවේ ඉස්ලාම් මුල් යුගයේ දහ්වාවේ මධ්‍යස්ථානය ලෙස ක්‍රියාත්මකවූයේ කුමන සහාබාවරයාගේ නිවසද?

(1) අබුතල්හා (රලි) (2) අර්කම් (රලි) (3) අබුබක්කර් (රලි) (4) අබූඋබෙයිදා (රලි)

38. අබුතාලිබ් තුමා හා කදීජා (රලි) තුමිය මරණයට පත්වූ වර්ෂය හැඳින්වෙන නම

(1) ආමුල් ෆීල් (2) ආමුල්හුසුන් (3) ආමුල්ජාහිලියා (4) ආමුල්කදීම්

39. රිදී ආභරණ සැදීම සම්බන්ධ පිරිමි කෙරෙහි වූ නීතිය කුමක් ද?

(1) අනිවාර්යයයි (2) සුන්නත් (3) මක්රූ (4) හරාම්

40. අහ්ලුල් කිතාබ් යනුවෙන් හැඳින්වෙන්නේ කවරහු ද?

(1) නබිතුමාගේ බිරිඳවරුන් (2) ආගම් කරුවන්

(3) නබිතුමාගේ පවුලේ අය (4) නබිතුමාගේ මිතුරන්

The National e-learning Portal, The General Education

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අවසාන වාර පරීක්ෂණය 2016

**11 ශ්‍රේණිය** **ඉස්ලාම් ධර්මය - II** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) කෙටි පිළිතුරු සපයන්න.

(i) අකීදාවේ පාරිශුද්ධතාවය ආරක්ෂා කිරීමට වෙහෙසවූ ඉමාම්වරු දෙදෙනෙක්ගේ නම් ලියන්න.
(ii) ෂිර්කුල් අෂ්කර්වලට උදාහරණ 02 ක් ලියන්න.
(iii) සකාතයේ පර්ලයන් කුමක් ද?
(iv) 'වහි'වල වර්ග දෙක කුමක් ද?
(v) සුන්නත් වූ සලාත් 02 ක් ලියන්න.
(vi) සකාත් ලබාගැනීමට සුදුසුකම් ලත් අල්කුර්ආනයේ සඳහන් කණ්ඩායම් 02 ක් නම් කරන්න.
(vii) නෝම්බි උපවාසය ඇල්ලීමට තහනම් කළ දිනයන් දෙකක් සඳහන් කරන්න.
(viii) මුස්ලිම්වරුන්ගේ සුද්ධ ස්ථාන දෙකක් ලියන්න.
(ix). ජාහිලීයියා කාලයේ තිබූ යහගුණ 02 ක් ලියන්න.
(x). දේපල හිමිවන්නන් දෙදෙනෙක් සඳහන් කරන්න. (ල.10×02=20)

(02) (i) ඉස්ලාමීය අකීදාවේ ලිහිල්බව නැතිකිරීමට සාධක වූ හේතු 04 ක් ලියන්න.
(ii) අහ්ලුස්සුන්නාහ් වල්ජමාත් නැමති අය කවුරුන් ද?
(iii) ඊමානයට පටහැනි වන කරුණු 04 ක් ලියන්න. (ල.4+3+3=10)

(03) (i) ඉස්ලාම් පවසන යහගුණ 04 ක් ලියන්න.
(ii) යහගුණ ගැන කියවෙන හදීසයක් ලියන්න.
(iii) ඉපැයීමේදී අත්හැරිය යුතු දේවල් 03 ක් ලියන්න. (ල.4+3+3=10)

(04) (i) ඉස්ලාම් ලබා දී ඇති මානව හිමිකම් 04 ක් ලියන්න.
(ii) ව්‍යාපාරයක් සඳහා මූලික කොටස් කුමක් ද?
(iii) ඉස්ලාම් පිළිගන්නා ආර්ථික උත්සාහයන් 03 ක් ලියන්න. (ල.4+3+3=10)

(05) (i) බිරිඳ විසින් ස්වාමි පුරුෂයාට කළයුතු වගකීම් 04 ක් ලියන්න.
(ii) දික්කසාද ක්‍රම 03 ලියන්න.
(iii) ඉද්දාවල් වර්ග කුමක් ද? (ල.4+3+3=10)

(06) (i) අල්කුර්ආණය එක්රැස්කළ ආකාරය ලියන්න.
(ii) ඉස්තිහාද් යනු කුමක් ද?
(iii) මුජ්තහිද්වරුන්ට තිබිය යුතු සුදුසුකම කුමක් ද? (ල.4+3+3=10)

(07) පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.
(i) අබූබක්ර් (රලි) කලීෆාවරයා ලෙස තේරීපත්වීමට හේතුවූ කරුණු
(ii) අහ්ලුස්සුන්නත් වල් ජමාඅත්
(iii) මස්ජිදුල් හරම්
(iv) ඉජ්තිහාද් (ල.10)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(2) | 2 -(3) | 3 -(2) | 4 -(2) | 5 -(4) | 6 -(1) | 7 -(4) | 8 -(3) | 9 -(1) | 10 -(2) |
| 11 -(3) | 12 -(2) | 13 -(4) | 14 -(2) | 15 -(2) | 16 -(3) | 17 -(1) | 18 -(3) | 19 -(1) | 20 -(3) |
| 21 -(4) | 22 -(1) | 23 -(1) | 24 -(3) | 25 -(4) | 26 -(1) | 27 -(2) | 28 -(2) | 29 -(3) | 30 -(4) |
| 31 -(2) | 32 -(4) | 33 -(3) | 34 -(4) | 35 -(1) | 36 -(3) | 37 -(2) | 38 -(2) | 39 -(4) | 40 -(2) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (i) ඉමාම් අහ්මද් ඉබිනු හම්බල්, ඉමාම් අබුල් හසන් අල් අළුඅරි, අබුල් මන්සූර් අළු මන්රුදි, අබු ජව්සර් අත්තහාව් (ii) අල්ලාහ්ගේ නාමයෙන් බොරුවට දිව්රීම, වසියම් කිරීම, නිමිති බැලීම (iii) නීයත් තැබීම / සුදුස්සන්ට ලබා දීම (iv) වහි මන්ලු / වහි හෛරු මන්ලු (v) තරාපීහ්, ලූහා, අවුරුදු දිනවල කරණ සලාතයන්, ග්‍රහණයන් ඇති වූ විට කරන සලාතය (vi) ෆකීර්, මිස්කීන්, ආමිල්, මුඅල්ලෆතුල් කුලුබ්, රිකාබ්, කාරිමීන්, ෆීසබිලිල්ලාහ් (vii) අවුරුදු දිනයන් දෙක, සැකයට පත් වූ දිනය, අයියාමුල් තෂ්රීක් දිනයන් (viii) මස්ජදුල් හරාම්, මස්ජිදුන් නබවි, මස්ජිදුල් අක්ෂා (ix) වීරත්වය, අමුත්තන්ට සංග්‍රහ කිරීම, උත්සාහය, පොරොන්දු ඉටු කිරීම (x) අෂ්හාබුල් බුරුැල්, අසබා, අල් අර්හාම් (ල.10×02=20)

(02) (i) දේශපාලන ප්‍රශ්ණ, ඉස්ලාම් සමාජය තුළ ඇති වූ අන්‍යන්ගේ අදහස්, ආගමිකයින් සමග ඇති වූ නෑ කම්, බුද්ධිමත්ව කටයුතු නොකර සිටීම, සිතට එකග නොවීම, සතුරන්ගේ කුමන්ත්‍රණ, මෝඩ අදහස්. (ii) නබිතුමානන් ඔහුගේ මිතුරන් අතර ඇති වී තිබූ විශ්වාසය මත ජීවත් වූ අය (iii) ඉල්හාද්, කුෆ්ර්, ෂිර්ක්, රිද්දන්

(03) (i) ඉවසීම, උස්සාහය, පහත්වීම, සමාවීම, (ii) නියත වශයෙන්ම යහගුණ සම්පූර්ණ කිරීමට මා නබි වශයෙන් යවා ඇත. (මෙවැනි හදීසයන්) (iii) රැවටීම, බොරු පොරොන්දු, සැඟවීම, පොලිය, හරාම් වූ දේවල් විකිණීම

(04) (i) ජීවත් වීම සඳහා අයිතිය, ගෞරවය ආරක්ෂා කර ගැනීම, පෞද්ගලික නිදහස් අයිතියට, සමානාත්මක අයිතිය, නීතියේ පිහිට ලබා ගැනීම, දේපල ලබා ගැනීම සඳහා අයිතිය (ii) ගැණුම්කරු, විකුණුම්කරු, වෙළඳ භාණ්ඩය, ඊජාබ් කබූල් (iii) අල් මුලාරබා, අල් මුෂාකරකා, අල් මුරාබහා, ඉජාජා, සලම්, ඉස්දිස්කාඋ, උගස

(05) (i) ස්වාමියාට යටහත් වීම, ඔහුගේ දේපලවලට ආරක්ෂාව ලබා දීම, ඔහුගේ අවශ්‍යතාවයන් සපුරා දීම, නායකත්වය ස්වාමියාට දීම (ii) හලාක්, ෆස්හු, කුල්උ (iii) ස්වාමියාගේ මරණය සඳහා ඉද්දා, ගැබ්ගෙන සිටීම සඳහා ඉද්දා, තලාක් රජඊ සඳහා ඉද්දා

(06) (i) අල්කුර්ආණය නබිතුමාට ලබා දීම, සහාබාවරු එය කට පාඩයම් කර දෛනික ජීවිතය ක්‍රියා කිරීම, අබු බක්කර් රලි තුමාගේ කාලයේ යමාමා යුද්ධයේදී 70වකට අධික හාෆිල්වරු මරණයට පත්වීම, අල්කුර්ආණය සෛද් ඉබිනු තාබිත් තුමාගේ නායකත්වයෙන් සංස්කරණය කර උස්මාන රලි තුමාගේ කාලයේ එහි පිටපත් කිරීමක් ඇතිවිය. (ii) ඉජ්තිහාද් යනු අලුත් ප්‍රශ්ණයක් මතුවන විට එය සඳහා උත්තරයක් අල්කුර් ආණයෙන් හෝ හදීස්වල නැති විට මෙය සම්බන්ධ ගැඹුරු දැනුමක් ඇති බුද්ධිමතුන් විසින් තීරණය සෙවීමයි. (iii) තක්වා ඇති මුස්ලිම්වරු, අරාබි භාෂාව ගැන ගැඹුරු දැනුමක් ඇති, අල්කුර් ආණයේ අල් හදීස් වල මනා දැනුමක් ඇති අය, පෙර මුජ්නහිද් වරුන්ගේ ඉජ්තිහාද් ගැන ඇති දැනුම.

(07) (i) ● නබි (සල්) තුමා, අබුබක්කර් රලි තුමාව සලාතය ඉටු කිරීමට ඉමාම් ලෙස පත් කිරීම. ● කුරෛසි කුලයට අයත් වීම ● නබි තුමා සමග ආරම්භ කාලයේ සිට සිටි මිත්‍රයා ● ඔහුගේ කැපකිරීම් හා යහගුණයන් (ii) ● අහ්ලුස්සුන්නා වල් ජමාඅත් යන වදනයේ නිර්වචනය ● ඔවුන්ගේ අකීදා නියායන් උදාහරණ : වහි, ඊමාන්, කද්ර්, අල්කුර්ආන් (iii) ● මුස්ලිම්වරුන්ගේ පළමු ........ (පුදබිම) ● කිබ්ලා දිශාව බලා සලාතය ඉටු කිරීම ● හජ්, උම්රා යන වගකීම් ඉටු කරන ස්ථාන ....... (iv) (ඉජ්තිහාද්) එහි නිර්වචනය අවශ්‍යතාවය ● මුජ්තහිද්වරුන්ට තිබිය යුතු සුදුසුකම් ● එහි ප්‍රයෝජනය (යන කරුණු වලට ලකුණු ලබා දෙන්න.)